DOI : 10.31357/fhssmst.2007.00674

# විදේශීය සංචාරකයින් විසින් සිදුකරන ළමා ලිංගික අපයෝජනය පිළිබඳ අපරාධ විද්‍යාත්මක විග්‍රහයක්

මාපා මුදියන්සේලාගේ ප්‍රියන්ත ප්‍රේමසිරි
පී.එස්.එස්.එස්. 1604/2002

අපරාධ විද්‍යාව ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය වෙත ඉදිරිපත් කරනු ලබන ස්වාධීන පර්යේෂණ නිබන්ධය

## පිදුම

ආදරණීය
අම්මාට සහ තාත්තාට
සෙනෙහසින්

## පර්යේෂකගේ ප්‍රකාශය

අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය ආචාර්ය එම්. සී. ස්වර්ණලතා පෙරේරා මහත්මියගේ උපදේශකත්වය හා මග පෙන්වීම යටතේ සම්පාදනය කරනු ලැබුවකි. මෙහි අන්තර්ගත කිසිදු කොටසක් වෙනත් විශ්ව විද්‍යාලයක හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක උපාධි අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද්දක් නොවන බව සහතික කරමි.

2007:03:22

දිනය

එම්. එම්. ප්‍රියන්ත ප්‍රේමසිරි

## උපදේශකතුමියගේ සහතිකය

අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා එම්. එම්. ප්‍රියන්ත ප්‍රේමසිරි විසින් ඉදිරිපත් තරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය අචාර්ය එම්. සී. ස්වර්ණලතා පෙරේරා වන මාගේ උපදේශකත්වය හා මග පෙන්වීම යටතේ සම්පාදනය කරනු ලැබුවකි. මෙම පර්යේෂණ නිබන්ධය ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා සුදුසු මට්ටමේ පවතින බව සහතික කරමි.

22-03-2007

දිනය

23 MAR 2007

අචාර්ය එම් .සී. ස්වර්ණලතා පෙරේරා

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

## ~ ස්තුතිය ~

ළමා අපයෝජනය යනු පුළුල් මාතෘකාවකි. ළමා ලිංගික අපයෝජනය යනු එහි එක් කොටසකි. ළමා අපයෝජන පිළිබඳව අප සමාජයේ දැන නුවණ එතරම් පුළුල්ව නොමැත. ඒ හේතුව නිසාම විවිධ අපයෝජන වලට වර්තමාන දරු පරපුර ගොදුරු වී බරපතල අහිතකර ප්‍රතිවිපාකයටත්ට මුහුණ දෙමින් සිටියි. එම තත්වය පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනවල අවශ්‍යතාවය මතුව ඇත.

අපරාධ විද්‍යා විෂය ක්ෂේත්‍රයට මා යොමු කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නන්දසේන රත්නපාල මහ ඇදුරුතුමාට මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරමි.

ළමා ලිංගික අපයෝජනය සමාජ ගැටළුවක් වශයෙන් අවබෝධකොට ගෙන සමාජයේ ගැඹුරු අවධානයක් යොමු කළ යුතු කාලය එළඹ ඇත. ඒ අරමුණින් සිදුකළ මෙම පර්යේෂණ නිබන්ධය සාර්ථක කරගැනීම පිණිස නිරන්තරයෙන් උපදෙස් ලබා දෙමින් නිසි ලෙස මහ පෙන්වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයන අංශ ප්‍රධාන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එම්. සී. ස්වර්ණලතා පෙරේරා මහත්මියට මාගේ ගෞරව පූර්වක ස්තුතිය පුද කරමි.

මෙම අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබා දුන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වත්මන් සභාපතිනි පද්මා වැත්තෑව මහත්මියටත්, හිටපු සභාපතිතුමා ඇතුළු ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය මණ්ඩලයට මාගේ ප්‍රණාමය පුද කරමි. මෙම නිබන්ධය අංගසම්පූර්ණ ලෙස පරීක්ෂණක ගතකොට දුන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නීති නිලධාරි, නීතිඥ රොහාන් විජේසේන සොයුරාටත්, සහකාර විමර්ශන නිලධාරි ප්‍රියකාන්ත සොයුරාටත් බෙහෙවින් කෘතඥ වෙමි.

එමෙන්ම මෙම පර්යේෂණය සඳහා තොරතුරු ලබා ගැනීමට උදව් වූ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ අන්තර් ජාතික ඒකකයේ නිලධාරීන් වෙතද මාගේ ස්තුතිය හිමි වේ. එමෙන්ම ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ සහ ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටද බෙහෙවින් ස්තුති වන්ත වෙමි. මේ සියලු කටයුතු කිරීමට ආදරණීය බිරිඳ සහ දියණිය ලබාදුන් සහයෝගය ද සෙනෙහසින් සිහිපත් කරමි.

## ~ පටුන ~

## පළමු පරිච්ඡේදය

**පර්යේෂණ විග්‍රහය**


1. මාතෘකාව හැඳින්වීම ---------------------------------------- 01-04

1.2 අරමුණු ---------------------------------------- 04

1.3 අධ්‍යයනයේ වැදගත්කම ---------------------------------------- 04-05

1·4 ගැටළුව ---------------------------------------- 05-07

1.5 උපන්‍යාසය ---------------------------------------- 07-08

1.6 නියැදිය ---------------------------------------- 08-09

1.7 පර්යේෂණ ක්‍රම වේදය ---------------------------------------- 09-15


## දෙවන පරිච්ඡේදය

**ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණීම**


2.1 ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ---------------------------------------- 16-29

2.2 ශ්‍රී ලංකාවට විදේශ සංචාරකයන්ගේ පැමිණීමේ මෑත කාලීන ප්‍රවණතා ---------------------------------------- 29-30

2·3 ළමා ලිංගික සංචාරක ව්‍යාපාරය ---------------------------------------- 30-34


## තෙවන පරිච්ඡේදය

**සංකල්පීය විග්‍රහය**


3.1 ළමයා පිළිබඳ නිර්වචන ---------------------------------------- 35-36

3.2 ළමා අයිතිවාසිකම් ---------------------------------------- 36-44

3.3 අපරාධය හැඳින්වීම ---------------------------------------- 44-53

## සිව්වන පරිච්ඡේදය

### න්‍යායාත්මක පසුබිම

4.1 ළමා අපයෝජන පිළිබඳ හැඳින්වීම ------------------------------ 54-64

4.2 විදේශීය සංචාරකයන් සිදුකරන ළමා ලිංගික අපරාධ ------------- 64-72

4.3 ළමා ලිංගික අපරාධ වල න්‍යායාත්මක පසුබිම ------------------- 73-95

## පස්වන පරිච්ඡේදය

### දත්ත විශ්ලේෂණය

5.1 ළමා ලිංගික අපරාධකරුවන්ගේ සුවිශේෂී ලක්‍ෂණ ---------------- 96-98

5.2 ළමා ලිංගික අපරාධකරුවන් අන්තර්ජාලය භාවිතා කරන ආකාරය------------------------------------------------ 98-103

5.3 ළමා ලිංගික අපරාධකරුවන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආකාරය ------------------------------------------------ 103-112

5·4 ප්‍රත්‍යයක අධ්‍යයන (case studies) ------------------------------ 112-125

## හයවන පරිච්ඡේදය

### පර්යේෂණ දත්ත ඇගයීම

6.1 ළමා ලිංගික අපයෝජකයන්ගේ හැසිරීම් රටා --------------------- 126-130

6.2 ළමා ලිංගික අපයෝජනවලට බලපාන සාධක --------------------- 131-136

6·3 ළමා ලිංගික අපයෝජනය වැළැක්වීම සඳහා නිගමන හා යෝජනා ------------------------------------------ 136-139

### ඇමුණුම්

01. ළමා ලිංගික අපයෝජනයට අදාල පනත් ------------------------ i-xLviii

02. 182 Worst Form of Child Labour Convention, 1999 ----------- xLix-Lv

03. Convention on the Right of Child ------------------------------ Lxvi-Lvii

04. Optional Protocol to the Convention on the on
the right of the child on the sale of Children, Child
Prostitution and Pornography ---------------------------------- Lviii-Lxv

05. A National Coordination Mechanism: The National
Child Protection Authority ------------------------------------- Lxvi-Lxxix

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

පළමු පරිච්ඡේදය

# පර්යේෂණ විග්‍රහය

## 1.1 මාතෘකාව හැඳින්වීම

ආසියාතික රටවල ස්වභාවික සෞන්දර්යය නැරඹීම සංස්කෘතික, පෞරාණික ඉතිහාසය ආදී කරුණු මුල් කොට ගෙන ලොව විවිධ රටවලින් ආසියාතික රටවල් වලට සංචාරකයෝ පැමිණෙති. මෙවැනි යහපත් අරමුණු මුල් කොටගෙන එන සංචාරකයන් අතර තම ලිංගික අවශ්‍යතා සන්තර්පණය කර ගැනීම සඳහා කුඩා ළමුන් සොයා මෙම රටවලට පැමිණෙන ළමාලෝලී කාමුක සංචාරක පිරිසක් ද ඒ අතර වෙති. ඔවුන් අනෙකුත් සංචාරකයන්ගෙන් වෙන් කොට හඳුනා ගැනීම දුෂ්කර කරුණකි. එවැනි ළමාලෝලී ලිංගික අපයෝජකයන් විසින් සිදුකරන ලිංගික අපයෝජන අද සමාජ ගැටලුවක් බවට පත් වී ඇත.

1980 හා 1990 දශකයේ තායිලන්තය පිලිපිනය සහ ශ්‍රී ලංකාව මේ සම්බන්ධව ප්‍රචලිතව තිබූ බව නොරහසකි. මුදල් හෝ වෙනත් උපකාරයන් ලබා දී කුඩා ළමයින් තම ලිංගික අවශ්‍යතා වෙනුවෙන් යොදා ගැනීම ඉතා සූක්ෂම ආකාරයෙන් මෙවැනි රටවල තවමත් සිදුවන බව අනාවරණය වී ඇත.

ආර්ථික වශයෙන් ලිංගික සංචාරක ව්‍යාපාරය වර්තමානයේ ඉතා විශාල ලාභදායී ජාත්‍යන්තර කර්මාන්තයක් බවට පත්ව තිබේ. මෙය සංවිධානාත්මකව ඉතා සූක්ෂම ආකාරයට සිදුවන බව පැහැදිලිය. මෙම ලිංගික සංචාරක ව්‍යාපාරය මගින් ළමයින් ලිංගික අපයෝජනයෙහි යෙදවීමට අමතරව ඒ තුළින් විවිධ ලාභ ඉපයීම් ද සිදුවෙමින් පවතී. මෙම තත්වයට දුප්පත්කම පමණක් හේතු වී නැති අතර නීතියේ පවතින අඩුපාඩු තත්වයන් ද හේතු වී තිබේ. ලෝක සෞඛ්‍ය සංවිධානය කළ සමීක්ෂණවල දී හෙළිදරව් වී ඇත්තේ ඉන්දුනීසියාව, මැලේසියාව, පිලිපිනය, තායිලන්තය සහ ජපානය යන රටවල ද

දළ ජාතික නිෂ්පාදිතයෙන් 14% ක්ම උපයා ඇත්තේ ලිංගික කර්මාන්තයෙන් බව වාර්තා වල දැක්වේ. ඔවුන් ළමා ගණිකා වෘත්තිය සම්බන්ධව නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කරනුයේ සංචාරක කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය නිසාත්, දේශීය ආර්ථිකය සඳහාත් ද මෙම ව්‍යාපාරය ඉතා වාසි සහගත බව පෙනෙන නිසාය. ඇතැම් රටවල සංස්කෘතික රටාවන් ද මෙසේ දරුවන් ලිංගික අපයෝජනයට ගොදුරු වීම කෙරෙහි බලපා ඇත. මේ අනුව සෑම වසරක් පාසාම ලොව පුරා ළමයින් මිලියන දෙකක් පමණ ලිංගික වෙළඳපොලට එක්වන බව හෙළි වී ඇත. (එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල, 2000, 2001)

විදේශීය ළමාලෝල කාමුක සංචාරකයන් විසින් සිදුකරන ළමා ලිංගික අපයෝජනය පිළිබඳව යම් යම් පර්යේෂණයන් සිදු කර ඇත. ළමුන් ලිංගික අපයෝජනයේ යොදවන අපයෝජකයන්, අතරමැදියන්, ඊට ගොදුරුවන ළමුන් පිළිබඳව ද අපරාධ විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම තුළින් මේ ගැටළුව පිලිබඳව ගැඹුරු අවබෝධයක් ලබාගත හැකිය. අපරාධ විද්‍යාත්මක න්‍යායන් සහ ක්‍රමවේදයන් ඔස්සේ මේ පිළිබඳව පර්යේෂණ සිදු කිරීමෙන් ලැබෙන දැන නුවණ උපයෝගි කොටගෙන මෙම ගැටළුවට විසඳුම් සොයා ගැනිමට හැකිවනු ඇත.

විශේෂයෙන් මෙවැනි අපරාධ අන්තර්ජාලය වැනි දියුණු තාක්‍ෂණික උපකරණ භාවිතයෙන් ඉතා සූක්‍ෂම ආකාරයට සිදු කෙරෙන බවටත් සංවිධානාත්මකව සිදුකෙරෙන බවටත් සාධක හමු වී ඇත.

ළමුන් කෙරෙහි කාමාශාව දක්වන විදේශිකයන් විවිධ උපක්‍රම භාවිතා කරති. බොහෝ විට ඔවුන් විසින් සංචාරක ප්‍රදේශවල බොහෝ දෙනෙකුට විශේෂයෙන්ම නිලධාරීන්ට ද ආදායම් උපදන ක්‍රම සලසා දේ. මෙම කෙටි කාලින වාසිය නැතිවන හෙයින් මේ සම්බන්ධව බලධාරීන්ට දැනුම් දීමට, පියවර ගැනිමට සමාජය පසුබට වනු ඇත. ළමුන් කෙරෙහි කාමාශාවක් දක්වන්නන් ළමයින්ට බොහෝ සේ උදව් කරති. ඔවුන් එම ළමයින්ට වෙනත්

ආකාරයෙන් ලබා ගත නොහැකි ආහාරපාන, ඇඳුම් පැළඳුම් හෝ බඩු භාණ්ඩ තෑගි ලෙස ලබා දෙති. බොහෝ විට දෙමාපියන්ට මුදලින් හෝ බඩු භාණ්ඩවලින් ආධාර කරති. නිවාස ඉදිකිරීම් හෝ අලුත්වැඩියා කිරීම් කර දෙති. ළමයින් සඳහා බොහෝ විට විදේශ චාරිකා පිළියෙල කර දෙන අතර සමහර ළමයින් දරුකමට හදා ගන්නා මුවාවෙන් ලබා ගනිති. තම ක්‍රියාකාරකම්වලට පිටුවහලක් වශයෙන් කුඩා ළමයින් කෙරෙහි කාමාශාවක් දක්වන විදේශිකයන් විසින් ආදායම් ජනනය කරන ව්‍යාපෘතින් ද පවත්වා ගෙන යති. කුඩා ළමයින් කෙරෙහි කාමාශාව දක්වන විදේශ සංචාරකයින් සඳහා ළමයින් සපයන සංවිධානාත්මක කණ්ඩායම් ද ඇත. ඔවුන් විසින් ළමා සහ වැඩිහිටි අසභ්‍ය චිත්‍රපට පොත්පත් ආදිය ද නිෂ්පාදනය කරති. මෙරට මුදලින් ඉතා සුළු මුදලකට නිපදවනු ලබන අසභ්‍ය ප්‍රකාශන ළමුන් කෙරෙහි කාමාශාව දක්වන්නන්ට ජාත්‍යන්තරව ඩොලර් සිය දහස් ගණන්වලට විකුණති. ළමුන් සම්බන්ධ අසභ්‍ය ප්‍රකාශන බොහෝ ප්‍රමාණයක් අන්තර්ජාලය (Web Site) ඔස්සේ ලබාගත හැක.

බටහිර රටවල කරන ලද පර්යේෂණවලට අනුව ළමයින් කෙරෙහි කාමාශාව දක්වන්නන් අතර බොහෝ දෙනෙකුට පරිගණක විශේෂඥ දැනුම තිබෙන බව සොයා ගෙන ඇත. මෙම ළමා ලිංගික අපයෝජනය දේශිය ළමා අපයෝජකයන් විසින් හා විදේශිය සංචාරක ලිංගික අපයෝජකයන් විසින් සිදු කරන ළමා ලිංගික අපයෝජනය වශයෙන් වර්ග කළ හැකිය.

ළමා අවධියේදි ළමා ලිංගික අපයෝජනයට ගොදුරුවීමේ ප්‍රතිඵල බොහෝ විට පසුකාලිනව වැඩිහිටි ජිවිතයේ දි කායික මානසික රෝග ඇති කිරීමට බලපායි. කායික වශයෙන් ඒඩ්ස් වැනි රෝග ද මානසික වශයෙන් නියුරෝසියාව, මනෝ ව්‍යාධිය, අසංවරභාවය ඇතිවෙන බවද, ලිංගික අපයෝජනයට ගොදුරු වන ළමුන් පසුකාලිනව ගණිකා වෘත්තියට යොමු විමත් ළමා අපයෝජකයන් විමත් දක්වා අහිසි ආකාරයට බලපෑම් ඇති වෙන බවටද පෙන්වා දි ඇත.

මෙම ලිංගික අපයෝජනය ඇති විමට හේතු සහ එය වර්ධනය විමට හේතු වී තිබෙන කරුණු ද එම තත්වය සමාජයේ පැතිරී තිබෙන ආකාරය ද එයින් ළමුන් ආරක්‍ෂා කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීම කාලෝචිතය.

## 1.2 අරමුණු

- ❖ විදේශිය සංචාරකයන් විසින් සිදුකරන ළමා ලිංගික අපයෝජනය පිළිබඳ පසුබිම වටහා ගැනිම.
- ❖ විදේශිය සංචාරකයන් විසින් සිදුකරන ළමා ලිංගික අපයෝජනය අපරාධ විද්‍යාත්මක න්‍යායයන් ආශ්‍රයෙන් පැහැදිලි කිරීම.
- ❖ සංචාරක ව්‍යාපාරය සහ ළමා ලිංගික අපයෝජනය අතර පවතින බැඳියාව සොයා බැලීම.
- ❖ විදේශිය සංචාරකයන් විසින් සිදුකරන ළමා ලිංගික අපයෝජනය වැළැක්වීමට යෝජනා ඉදිරිපත් කිරීම.
- ❖ සමාජය දැනුවත් කිරීම.

## 1.3 අධ්‍යයනයේ වැදගත්කම

විදේශිය සංචාරකයන් විසින් සිදුකරන ළමා ලිංගික අපයෝජනය වෙරළාශ්‍රිත ප්‍රදේශයන්හි ඉතා රහසිගතව ක්‍රියාත්මක වේ. විදේශිය සංචාරකයන් සිදුකරන ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමුන් විවිධාකාරයේ ගැටළුවලට මුහුණ පාති. ළමා ලිංගික සංචාරකයෝ ශ්‍රී ලංකාවේ සංචාරක වෙරළ තිරයන්හි ඉතා සූක්‍ෂම ආකාරයෙන් ක්‍රියාත්මක වෙති. විශේෂයෙන් අන්තර්ජාලය වැනි නූතන තාක්‍ෂණ ක්‍රමවේදයන් ද මේ සඳහා යොදා ගැනිම දක්නට ලැබේ. තැරැව් කරුවන් මාර්ගයෙන් තම ලිංගික අවශ්‍යතා ඉටු කර ගැනිමට ළමුන් සොයා ගන්නා විදේශිය ළමා ලිංගික අපයෝජකයෝ ද වෙති. සංචාරක වෙරළ තිරයන්හි ජීවත් වන ප්‍රජාව වෙත ඉතා මිත්‍රශිලි ආකාරයෙන් සමීප වන විදේශිය සංචාරක ළමා ලිංගික අපයෝජකයෝ තම ලිංගික අරමුණු ඉටුකර ගැනිමට සුදුසු පවුල්

ඉතා පහසුවෙන් හඳුනා ගනිති. එම පවුල් වෙත කෙසේ හෝ සමීප වී විවිධ උදව් උපකාර ලබා දී ළමුන් ලිංගිකව අපයෝජනයට ගොදුරු කර ගනිති. ගැහැණු ළමුන්ට වඩා ඔවුන් විශේෂත්වයක් දක්වනුයේ පිරිමි ළමුන් වෙතය. ඊට ප්‍රධාන වශයෙන් හේතු කිහිපයක් බලපායි. සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ආරම්භක අවධියේ විදේශීය සංචාරකයන් තුළ "ලිංගික අපයෝජකයාට" ලිංගික ක්‍රියාවන්ගෙන් ඒඩ්ස් වැනි ලෙඩරෝග පිරිමි ළමුන්ගෙන් බෝවන්නේ නැත යන විශ්වාසයක් තිබුණි. වර්තමානය වන විට වෙරළ තීරයේ ඉතා පහසුවෙන් පිරිමි ළමුන්, විදේශීය ළමා ලිංගික අපයෝජකයන්ට ගොදුරු කර ගැනීමට අවස්ථාව සැලසී ඇත. ඊට ප්‍රධාන වශයෙන් වෙරළ ආශ්‍රිතව ජීවත් වන ජනතාවගේ පීඩිත ජීවන තත්වය හේතුවී තිබෙන බව වාර්තා මඟින් පෙන්වා දෙයි. ඉහත කරුණු මුල්කරගෙන අපරාධ විද්‍යාත්මකව ඊට බලපාන සාධක සොයා බලා සංචාරක ළමා ලිංගික අපයෝජකයන්ගේ හැසිරීම් රටාව පිළිබඳව අධ්‍යයනය කිරීම වැදගත්වේ. එමඟින් ලැබෙන දැන නුවණ උපයෝගී කොටගෙන විදේශීය ළමා ලිංගික සංචාරකයන් සම්බන්ධයෙන් අපරාධ යුක්තිය ක්‍රියාත්මක කරන ආයතන වලට මඟ පෙන්වීමක් ලබා දීමට මෙමඟින් අපේක්ෂා කරමි.

## 1.4 ගැටලුව

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතව විදේශීය ළමා ලිංගික අපයෝජකයන්ගේ අපරාධකාරී හැසිරීම්වල බලපෑම සමාජයට කෙසේ බලපාන්නේ ද? යන්න පිළිබඳ වර්තමානයේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන විවිධ අධ්‍යයනයන් සිදු කරති.

විදේශීය සංචාරකයන් විසින් සිදු කරන ළමා ලිංගික අපයෝජනය සමාජ ගැටළුවක් වශයෙන් හඳුනාගත හැකිය. සංචාරකයන් වෙරළාශ්‍රිත ප්‍රදේශවල ළමුන් ලිංගික කටයුතුවලට යොදාගැනීම, පිරමි ළමුන් යොදාගෙන අසභ්‍ය කාමුක ප්‍රකාශන නිෂ්පාදනය කිරීම වැනි සමාජ අපගමනයට හේතුවන ක්‍රියා මෑත කාලයේ බහුලව වාර්තා වී තිබේ. එසේම වාර්තා නොවෙන්නාවූ සිද්ධීන් වාර්තා වූ ප්‍රමාණයට වඩා බෙහෙවින් වැඩිය. මෙම

සිද්ධීන් වාර්තා නොවීමට හේතු වන්නේ මෙවැනි ළමා ලිංගික අපයෝජන සංවිධානාත්මකව සිදුවීමය. ළමා ලිගංක අපයෝජනයේදි එම අපයෝජනය ළමුන්ට නොතේරෙන ආකාරයෙන් හෝ "සෙල්ලමක් හෝ රහසක් වශයෙන්" කිරීම, ළමයාට තර්ජනය කිරීම, ළමයා ලැජ්ජාවට පත්වීම නිසා මෙම අපයෝජන වාර්තා නොවෙන තත්වයක් දක්නට ඇත. එමෙන්ම එමගින් අනිසි ආර්ථිකමය වාසි ලබන පිරිසක් සිටීම ද මේ තත්වයට හේතු වී ඇත. එමෙන්ම විදේශික සංචාරකයන් විසින් සිදුකරන ළමා ලිංගික අපයෝජන සම්බන්ධයෙන් මතුවන තවත් ගැටලුවක් නම් නිසියාකාරයෙන් නිතිය ක්‍රියාත්මක නොවිමයි. මෙසේ විදේශිය ළමා ලිංගික අපයෝජකයන්ට ගොදුරුවන ළමුන් එහි බලපෑම් වශයෙන් පසු කාලිනව යම්යම් අපචාරී ක්‍රියාවල යෙදෙති· විශේෂයෙන් මෙවැනි කාමුක සංචාරකයින්ට ළමුන් සපයන අතරමැදියන් වීමත්, ඔවුනට මත්ද්‍රව්‍ය සැපයීම වැනි කටයුතුවල යෙදීමත්, ළමා අපයෝජකයින් වී සමාජ අපගාමී ක්‍රියාවල යෙදෙන්නන් දක්වා මෙහි බලපෑම අහිතකර ආකාරයෙන් සිදුවෙයි· සමාජයේ පසුගිය දශක තුනක කාලය තුළ සංචාරක ව්‍යාපාරයේ ඇති වූ ප්‍රගතිය සමග නොයෙකුත් ආකාරයේ සමාජ ගැටලු උද්ගත වී සමාජ විසංවිධානකාරී තත්වයක් දක්වා එම තත්වය වර්ධනය වී ඇත· සංචාරක ව්‍යාපාරයට ළමුන් සම්බන්ධවිමේ දැඩි ප්‍රවණතාවයක් වර්තමානයේ දක්නට ඇත. සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතව විශේෂයෙන් විදේශිය සංචාරක ව්‍යාපාරයට ළමුන් සෘජුව සම්බන්ධ වීමෙන් විවිධාකාර වූ අපයෝජන වලට ගොදුරු වීමෙන් ඉතා අහිතකර ප්‍රතිඵල උද්ගතව ඇත.

විදේශිය සංචාරකයන්ට ළමුන් ලිංගික කටයුතු සඳහා සැපයීම සංවිධානාත්මකව ජාලයක් ආකාරයට ක්‍රියාත්මක වේ. මුදල් හෝ තෑගි ආදි දේ දීම තුළින් කුඩා ළමුන් මේ තත්වයට ගොදුරු කර ගැනිමක් දක්නට ලැබේ.

විදේශිය සංචාරකයන් වෙත ලිංගික කටයුතු සඳහා ළමුන් යෙදවීම පිළිබඳ සංඛ්‍යා දත්ත සොයා ගැනිම දුෂ්කරය. ඒ පිළිබඳව ගැඹුරින් පර්යේෂණ සිදු කර තිබෙන්නේ ද අල්ප වශයෙනි.

මේ තත්වයෙන් ළමුන් මුදවා ගැනීමට දණ්ඩ නීති සංග්‍රහය පවා සංශෝධනය කොට නව නීති හඳුන්වා දී ඇත. එමෙන්ම සියලුම ආකාරයේ අපයෝජනයන් ගෙන් ළමුන් ආරක්ෂා කිරීම සඳහා 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත මගින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා ඇත (ඇමුණුම 05 බලන්න) එසේ නීතිමය ප්‍රතිපාදන තිබුණ ද විදේශිය සංචාරකයන් ශ්‍රී ලංකාවේ පිරිමි ළමුන් ලිංගික කටයුතු වලට යොදා ගැනීමට විවිධ උපක්‍රම භාවිතා කෙරේ. විශේෂයෙන් නූතනයේ දියුණු තාක්ෂණික ක්‍රම වේද අතුරින් අන්තර් ජාලය පවා භාවිතා කොට ගෙන තම ලිංගික අරමුණු ඉටු කර ගැනීමට ළමුන් ගොදුරු කර ගන්නා තත්වයට වර්ධනය වී ඇත.

ඉහත කරුණු පිළිබඳව අපරාධ විද්‍යාව පිළිබඳ පර්යේෂණය කරන පර්යේෂකයෙකු වශයෙන් කරුණු සෙවීමේ දී එම තත්වය සමාජයට හානිදායක ගැටලුවක් වශයෙන් මා විසින් හඳුනාගෙන ගෙන ඇත.

## 1.5 උපන්‍යාසය

විදේශිය සංචාරක ලිංගික අපයෝජකයන් බොහෝ විට තම ලිංගික අවශ්‍යතා ඉටු කර ගැනීමට තම රටේ සිට වෙනත් රටවලට සංචාරය කරනු ලබති· විශේෂයෙන් මේ සඳහා බලපාන සාධක අතර ළමා ලිංගික අපයෝජකයන්ට එරෙහිව පවතින නීතිමය තත්වයේ දුර්වලතා මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන්නේ දැයි සොයා බැලීම කාලෝචිතය·

මේ සඳහා දුප්පත්කම බලපාන්නේ දැයි අධ්‍යයනය කල යුතුය· සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතව කටයුතු කරන නිලධාරීන් සංචාරක ළමා ලිංගික ව්‍යාපාරයට සෘජුව හෝ වක්‍රව නොයෙකුත් වාසි අරමුණු කොටගෙන උදව් උපකාර කරන්නේ දැයි විමසිය යුතුය· එමෙන්ම නූතන සන්නිවේදන තාක්ෂණයේ ප්‍රබල ස්ථානයක් හිමිකරගෙන ඇති අන්තර්ජාලය මේ සඳහා ඉවහල් වන්නේ දැයි සොයා බැලිය යුතුය· එමෙන්ම විදේශික ළමා ලිංගික අපයෝජකයන්ට ඉතා පහසුවෙන් ශ්‍රී ලංකාවට පැමිණීමට